# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/183/2023 (PSC)**

පී.ආර්.චන්ද්‍රසිරි
**අභියාචක**
**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.01.27**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් කේ.වී.වයි.ආර්.ගුණරත්න මහත්මිය.

අභියාචක විසින් 2023.10.02 වන දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනා පෙත්සමේ 4.2 ඡේදය මඟින් ඉල්ලා ඇත්තේ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අභියාචක වෙත නිකුත් කර ඇති විනය නියෝගය බල ශූන්‍ය කරන ලෙසයි. එකී රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය, 2023.09.04 දිනැතිව අභියාචකටද පිටපතක් සහිතව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කර ඇති ලිපියේ දක්වා ඇත.

එම ලිපියේ ප්‍රථම ඡේදයේ අංක I යටතේ අභියාචකගේ විශ්‍රාම පාරිතෝෂිකයේ වටිනාකම සම්පූර්ණයෙන්ම අඩු කිරීමට නියම කර ඇත. ඒ සමඟම අංක II යටතේ ඔහු විසින් විශ්‍රාම පාරිතෝෂිකය ලබා නොගන්නේ නම්, යනුවෙන් සඳහන් කර ඇත. පාරිතෝෂිකයේ සම්පූර්ණ වටිනාකම නොගෙවන ලෙසට තීරණය කර ඇති අවස්ථාව එළඹුන විට, නැවත වරක් එම පාරිතෝෂිකය ලබා ගැනීමට හෝ නොගැනීමට අවස්ථාවක් ලැබෙන්නේ නැත.

එසේ නම් බැලූ බැල්මටම රාජ්‍ය සේවා කොමිෂන් සභා විනය නියෝගයෙහි දෝෂයක් ඇති බව පෙනී යයි.

කෙසේ වෙතත් ඉහත කී රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය අනුව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදල්, ආර්ථික ස්ථායීකරණ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපියක් මඟින්, මේ වන විට අභියාචකගේ විශ්‍රාම වැටුප් ගෙවීම අනුමත කර ඇත. තවද විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් අවසාන තීරණ ගැනීමේ බලධාරියා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්වරයා ය. එම තත්ත්වය යටතේ, එකී ලේකම්වරයා විසින් දැනටමත් අභියාචක වෙත විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් තීරණයකට එළඹී ඇති බව පැහැදිළි වේ. මෙම තත්ත්තය විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 12:2 වහන්තියේ පැහැදිළිව සඳහන් කර ඇත. එම වගන්තිය පහත දැක්වේ.

“නිළධාරියකු රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගත් කාලයෙහිදී පැවැති, ඒ විශ්‍රාම ගැනීමෙන් පසු අවසන් වුණු යම් පරීක්ෂණයකින් ඔහුගේ සේවා කාළය තුළ යම් නොසැලකිලිමත්කමක්, අක්‍රමිකතාවක් හෝ විෂමාචාරයක් ඔහුගෙන් කෙරී ඇති බව අනාවරණය වූ අවස්ථාවක, ඒ පරීක්ෂණයේදී කරුණු තීරණයන් සම්බන්ධයෙන් ස්වකීය නිදහසට ඉදිරිපත් කළ කරුණු සතුටුදායක නොවෙතැ යි නියම බලධරයා විසින් සැළකුවහොත් හෝ ඒ තීරණ සම්බන්ධයෙන් ඔහු නිදහසට කරුණු ඉදිරිපත් නොකළහොත්, මේ ව්‍යවස්ථා යටතේ ඒ නිළධාරියා හට ගෙවිය යුතු හෝ ප්‍රධානය කළයුතු යම් විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් දීමනාවක් නතර කිරීම හෝ අඩුකිරීම රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් විසින් කළ හැකිය.’’

එම තත්ත්වය යටතේ, මෙම විනිශ්චය අධිකාරය විසින් අභියාචක ඉල්ලා ඇති පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය වෙනස් වීමකට යටත් වුවද, ඉහත කී විශ්‍රාම වැටුප් සම්බන්ධ නිසි බලධරයා විසින් නිකුත් කර ඇති නියෝගය නිශ්ක්‍රීය වන්නේද යන කරුණ ප්‍රශ්න සහගත වේ.

මෙම ගැටළුව පැන නැඟී ඇත්තේ, නීතියේ විධි විධාන අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණයකට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඇති අයිතිවාසිකම ක්‍රියාත්මක කිරීම සඳහා නීතියෙන් අවසර දී ඇති කාලපරිච්ඡේදය

නිම වීමට පෙර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ තීරණය ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන තිබීම හේතුවෙන් බව පෙනී යයි.

මෙම අවස්ථාවේදී ඉහත කී නීතිමය තත්ත්වයන් පැන නැඟී ඇති නිසා, මෙම කරුණ සම්බන්ධයෙන් වන පරීක්ෂණය ආරම්භ කිරීමට පෙර, ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිරීක්ෂණ විනිශ්චය අධිකාරය වෙත එවන ලෙසට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු.

තවද මේ අවස්ථාවේදී අභියාචක දන්වා සිටින්නේ, ඉහත කී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය ප්‍රකාශයට පත්කර දැනට අවුරුදු දෙකකට අධික කාලයක් ගතවී ඇතත්, මෙතෙක් ඔහුට කිසිදු විශ්‍රාම වැටුපක් ලැබී නොමැති බවයි. මෙම කරුණු කෙරෙහිද විශේෂයෙන් අවධානය යොමු කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දැනුම් දෙමු. කොමිෂන් සභා නිරීක්ෂණ වාර්තාව සඳහා 2026.04.09 දින නැවත කැඳවන ලෙස දැනුම් දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/